ශ්‍රී ලංකාවේ

# මාධ්‍ය ප්‍රතිපත්තිය සහ නීතිය ;

## *නෛතික, කර්මාන්තමය, අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ සහ දේශපාලන ආර්ථිකය*


තිලක් ජයරත්න
සරත් කැල්ලපත

කිශාලි පින්ටෝ-ජයවර්ධන
ගෙහාන් ගුණතිලක

*සංස්කරණය*

ඩේවිඩ් පේජ්
විලියම් ක්‍රොව්ලි
කිශාලි පින්ටෝ-ජයවර්ධන

**ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිපත්තිය සහ නීතිය ;**

***නෛතික, කර්මාන්තමය,අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ සහ දේශපාලන ආර්ථිකය***

පළමු මුද්‍රණය- 2012 ඔක්තෝබර්

© සියලු හිමිකම් ඇවිරිණි. නිසි අවසරයකින් තොරව මේ ප්‍රකාශනයෙහි කිසිදු කොටසක් ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් හෝ පිටපත් කිරීමේ යම්කිසි ක්‍රමයක ට නැවත සකස් කිරීම, ගබඩා කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ.

ISBN : 978-955-4596-00-9

පොදු රාජ්‍ය මණ්ඩලයීය අධ්‍යයන ආයතනය,
ලන්ඩන් විශ්ව විද්‍යාලය, දෙවන මහල,
සවුත් බ්ලොක්, සෙනෙට් හවුස්, මැෆට් ස්ට්‍රීට්,
ලන්ඩන් WCIE 7HU,
එක්සත් රාජධානිය.

දුර : +44(8) 29 7862 88 44
විද්‍යුත් ලිපිනය: info@mediareformlanka.com
වෙබ් අඩවිය: www.mediareformlanka.com/

# අන්තර්ගතය

## පළමු කොටස - **ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිපත්තිය සහ නීතිය ;**

***මුද්‍රිත මාධ්‍යය ට අදාළ ව නෛතික, කර්මාන්තමය සහ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ***


1. **හැඳින්වීම** ----------------------------------------20

2. **ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණයක්** -------------------------------- 24
   - 2.1. මාධ්‍ය වපසරියේ ස්වභාවය
   - 2.2. ශ්‍රී ලාංකේය මාධ්‍යයේ විවිධාංගීකරණය
   - 2.3. රජය එ. පුද්ගලික මාධ්‍ය

3. **මාධ්‍ය නීති ප්‍රතිසංස්කරණ** -------------------- 40
   - 3.1. ප්‍රාරම්භක සලකුණු
   - 3.2. ආර්.කේ.ඩබ්ලිව් කමිටු වාර්තාව
   - 3.3. 1996 සිට මාධ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ සමාලෝචනයක්
     - අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ
     - ආ) මාධ්‍ය ප්‍රකාශන, මාධ්‍ය ප්‍රඥප්ති සහ ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය
     - ඇ) ස්වාධීන විකාශන අධිකාරිය
     - ඈ) අධිකරණය ට අපහාස කිරීම
     - ඉ) පාර්ලිමේන්තු වරප්‍රසාද
     - ඊ) ලේක් හවුස් අයිතිය පුළුල් කිරීම
     - උ) සාපරාධී අපහාසය
     - ඌ) තොරතුරු දැනගැනීමේ අයිතිය

4. **මාධ්‍ය ගැටලු සම්බන්ධ අධිකරණ ප්‍රතිචාරය** -- 86

5. **ශ්‍රී ලාංකේය මාධ්‍ය සම්බන්ධ නූතන ගැටලු** --- 96
   - 5.1. මාධ්‍ය නිදහස
   - 5.2. ආණ්ඩුවේ නියාමන සමග අනන්‍යාභිමුඛ ව මාධ්‍ය වල ස්වයං නියාමනය
   - 5.3. ආයතනයික ව්‍යූහය සහ රාජ්‍ය නොවන අංශයේ ප්‍රතිපත්ති
   - 5.4. මාධ්‍ය ප්‍රමිතීන්, හොඳ ම භාවිතයන් සහ වෘත්තීය භාවය
   - 5.5. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ විධික්‍රම වෙත ප්‍රවේශය

5.6. වාර්ගිකත්වය සහ භාෂාව
5.7. ස්ත්‍රී පුරුෂ භාවය
5.8. වෙළඳපොළ සන්දර්භය
5.9. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ සෝදාපාළුව
අ) වාරණය
ආ) ඝාතන සහ අතුරුදන්වීම්: ත්‍රස්තවාදය වැළැක්වීම සහ හදිසි නීති
ඇ) තිස්සනායගම් නඩුව
5.10. ඉදිරිය බැලීම: පශ්චාත් යුධ සන්දර්භය තුළ මාධ්‍යය

6. **මාධ්‍ය අධ්‍යාපනය සහ විෂය මාලා**
6.1. වර්තමාන ක්‍රමයේ සමාලෝචනයක්
6.2. මාධ්‍ය අධ්‍යාපනයේ සර්වත්‍ර ප්‍රමිතීන්
6.3. විශ්ව විද්‍යාල විෂය මාලා
6.4. පුහුණු ආයතන සහ විද්‍යාල
6.5. ආයතනයික සහ ආකල්පමය අභියෝග: සන්සන්දනාත්මක විශ්ලේෂණයක්

දෙවන කොටස- **ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිපත්තිය සහ නීතිය ;**

***ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍යයේ දේශපාලන ආර්ථිකය***

1. **හැඳින්වීම**

2. **සමස්ත පර්යාලෝකය**
2.1. මුල් කාලය පිළිබඳ ඇතැම් ප්‍රත්‍යවේක්ෂණයන්
2.2. කැරළිකාර තත්වයන්ගේ සහ බෙදුම්වාදී යුද්ධයන්ගේ බලපෑම
2.3. නැවත ලබාගත් නිදහස සහ අහිමි වූ නිදහස
2.4. සිද්ධි අධ්‍යයනයක්: භෑ
2.5. සන්ධාන රජයේ බොරු මුහුණ
2.6. මාධ්‍යය සහ දේශපාලන තන්ත්‍රය අතර සබඳතා ඉහළ පහළ ගිය යුගය
2.7. රාජපක්ෂ පාලන තන්ත්‍රය යටතේ මාධ්‍ය නිදහස
2.8. රට අතීරණාත්මක මගක
2.9. නිදහස් මාධ්‍ය සඳහා සටන දිගටම
2.10. භාෂණයේ නිදහස මහත් අනතුරක
2.11. ගැටලුවේ සමාජ-සංස්කෘතික විශාලත්වය

3. **ශ්‍රී ලංකා මාධ්‍යයේ හිමිකාරිත්වයේ රටාවන්**
   - 3.1. රාජ්‍ය හෝ පුද්ගලික හිමිකාරිත්වය?
   - 3.2. හිමිකාරිත්වයේ ව්‍යූහය
   - 3.3. හිමිකාරිත්වය පිළිබඳ ගැටලු

4. **මාධ්‍ය අයිතීන් : අන්තර්ජාතික මාධ්‍යයෙන් පීඩනය**
   - 4.1. සාමාන්‍ය ප්‍රත්‍යවේක්ෂණයන් සමහරක්
   - 4.2. ආණ්ඩුවේ ක්‍රියා
   - 4.3. සෘජු අතපෙවීම් සහ නෛතික සංකීර්ණතා
   - 4.4. මාධ්‍ය වෙත තර්ජන එල්ල කිරීම සඳහා යොදාගත් උපායන්
   - 4.5. මාධ්‍ය සංවිධානවල සැකසුම හා ස්වභාවය
     - 4.5.1. ව්‍යූහය
     - 4.5.2. මහජන සහයෝගය එක්රැස් කිරීම
     - 4.5.3. යොදාගන්නා උපක්‍රම
     - 4.5.4. මාධ්‍ය උපක්‍රමවල ඵලදායීතාවය
     - 4.5.5. මාධ්‍ය භාවිතයන්
     - 4.5.6. මාධ්‍ය සහ මැතිවරණ

5. **මාධ්‍ය අධ්‍යාපනය**
   - 5.1. අධ්‍යාපනය සඳහා අර්ථදැක්වීම
   - 5.2. සන්ධිස්ථාන සහ සැතපුම් කණු
   - 5.3. විශේෂඥ පුහුණුව
   - 5.4. ශිෂ්‍යත්ව සහ විදෙස් පුහුණුව
   - 5.5. මාධ්‍ය අධ්‍යාපනය සහ දේශපාලනය
   - 5.6. මාධ්‍ය සාක්ෂරතාවය
   - 5.7. මාධ්‍ය අධ්‍යාපනය අධ්‍යයන සහ පුහුණුව ට සම්බන්ධිත ගැටලු
   - 5.8. මාධ්‍ය අධ්‍යයනය සහ විෂය මාලා

<u>තුන්වන කොටස:</u> **නිගමනය, නිරීක්ෂණ සහ යෝජනා**

# පෙරවදන

2009 වර්ෂයේදී ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යයන ආයතනය විසින් ආරම්භ කළ පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන සොයාගැනීම්වලින් සමහරක් මෙසේ ප්‍රකාශනය කිරීම ට හැකිවීම The Media Reform Lanka Initiative ව්‍යාපෘතියේ මහත් සතුට ට හේතු වේ. එහි ප්‍රධාන ව්‍යාපෘතියේ අරමුණ වූයේ මාධ්‍ය ප්‍රතිපත්ති, නියාමන සහ නීතිය සම්බන්ධයෙන් නව විෂය මාලාවක් ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික ආයතන සමග කටයුතු කිරීමයි. ගැටලු සඳහා ප්‍රවේශනීය මගපෙන්වීමක් ලබාදීම මෙන්ම, ශ්‍රී ලංකාව ට සහ දකුණු ආසියාවේ ඇතැම් රටවලට සුවිශේෂී ගැටලු සම්බන්ධයෙන් විසල් අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමද එහි අරමුණ විය. www.mediareformlanka.com/ සවිස්තරාත්මක වෙබ් අඩවිය නිර්මාණය කළේ ද මෙම ව්‍යාපෘතියේ ම ඉදිරි පියවරක් ලෙස ය.

මෙකී මුලපිරීම ගොඩනැංවුණේ 2008 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද- ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය හා ශ්‍රී ලංකාව යන දකුණු ආසියාතික රටවල් හතරක පොදු ගැටලු හඳුනාගත්-2008 වසරේදී සම්පූර්ණ කරන ලද පර්යේෂණ පරිශ්‍රමයක් මත පිහිටා ය. (මෙම පර්යේෂණ වාර්තාව www.mediasouthasia.org හි අඩංගු වේ.) එහිදී අප දුටු ආකාරයට පොදු අභියෝගය වූයේ මහජන සන්නිවේදනයේ වෙනස් මට්ටම්වලදී, විවිධත්වයේ විෂය ක්ෂේත්‍රය ට ඉඩ ලබාදෙමින්, මහජන භාරය සඳහා මාධ්‍ය භාවිතය සහ දකුණු ආසියාව පුරා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ට නව තාක්ෂණයන් යොදාගැනීමයි.

දකුණු ආසියානු කලාපයේ නියාමන පාලන තන්ත්‍රයන්ගේ වඩාත් වැදගත් අංගයන් කලාපීය හා අන්තර්ජාතික වැඩසටහන් දේශීය වශයෙන් විකාශය කිරීම, ඒවායේ තත්වය සහ ඒවා වෙත ප්‍රවේශ වන විධික්‍රම කෙරෙහි සැලකිලිමත් වන බව අපි දුටිමු. ජාතික ආරක්ෂාවේ අවශ්‍යතා පිළිබඳ සංජානනය විවිධ දකුණු ආසියාතික රටවල් අතර විචලනය වන අතර, චන්ද්‍රිකා සේවා සම්බන්ධ නියාමන පසුබිම හා ඒවා ට ප්‍රවේශ වීම සඳහා පවතින කොන්දේසි ද මෙසේම ය. ජාතික නියාමන ඒජන්සිවල වගකීම් සහ ඔවුන්ගේ සාමාජිකයන් පුහුණුකිරීම් අතර වෙනසක් තිබේ. ජාතික සහ කලාපීය භාෂාවන් තුළ විකාශන සේවා සමග සබැඳී තිබෙන සංස්කෘතික

ගැටලු, සහ මෙකී භාෂාවන් සංවර්ධනය කිරීමේදී හා වැඩිදියුණු කිරීමේදී ඒවායේ භූමිකාව අවධානය ට ලක්වූ රටවල් සම්බන්ධයෙන් සුවිශේෂී විය.

*ප්‍රධාන පර්යේෂණ පත්‍රිකා*

Media Reform Lanka ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද පර්යේෂණ පත්‍රිකා, රචනා සහ සෙසු ලේඛන සම්පූර්ණ වශයෙන් ලුහුඬු රහිත ව, ඒ සඳහා විශේෂයෙන් නිර්මාණය කළ වෙබ් අඩවිය-www.mediareformlanka.com/ වෙත ප්‍රවේශ වීම මගින් ලබාගත හැක. මෙම ප්‍රකාශනයේ අන්තර්ගත වන්නේ ප්‍රධාන පර්යේෂණ පත්‍රිකාවන් ද්විත්වය වන, කිශාලි පින්ටෝ-ජයවර්ධන (ජ්‍යෙෂ්ඨ නීතීඥ සහ Media Reform Lanka Initiative ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ උපදේශිකාව) විසින් ගෙහාන් ගුණතිලක (නීතීඥ හා සහකාර පර්යේෂක) සමග එක්ව ලියන ලද *Legal, Industry and Educational Reforms Pertaining to the Print Media* සහ තිලක් ජයරත්න (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවයේ හිටපු අධ්‍යක්ෂ) සහ ජ්‍යෙෂ්ඨ විකාශක සරත් කැල්ලපත විසින් ලියන ලද *The Political Economy of the Electronic Media In Sri Lanka* හි සිංහල පරිවර්තනයයි.

කිශාලි පින්ටෝ-ජයවර්ධන සහ ගෙහාන් ගුණතිලක ගේ පර්යේෂණ පත්‍රිකාව මගින්, මාධ්‍ය ප්‍රතිපත්තිය නෛතික, ආයතනයික හා අධ්‍යාපනික දෘෂ්ටිකෝණයකින්, ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන්නේ සහ අවශ්‍ය විය හැක්කේ කොතැනකටද යන්න හඳුනාගන්නා දැක්මක් සහිත ව, තනි පුද්ගලයන්ගේ අයිතීන් සුරක්ෂණය කරනා පරිදි සහ මාධ්‍ය කර්මාන්තයේත් අදාළ සමාජ සහ නෛතික ආයතන වල ක්‍රියාත්මක භාවයත් ආරක්ෂා වන පරිදි විශ්ලේෂණය කෙරේ. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල මට්ටමේදී මාධ්‍ය ප්‍රතිපත්තිය හා නීතිය ඉගැන්වීම ද විමසා බලන පත්‍රිකාව, මාධ්‍ය අධ්‍යයනයක් සඳහා සම්බන්ධ ව සිටින විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ට සහ මහාචාර්යවරුන් හට විෂය පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගැනීම සඳහා වන රාමුවක් ද යෝජනා කරයි.

ස්වාධීනත්වයේ මුල් යුගයේදී ශ්‍රී ලංකාවේ වෘත්තීය ජනමාධ්‍යවේදයේ පැවති ඉහළ සාක්ෂරතාවය හා ශක්තිමත් සම්ප්‍රදායන් අවධාරණය කරනා කතුවරු, ගතවූ දශකවලදී සාධක ගණනාවක් විසින් ස්වාධීන ජනමාධ්‍යවේදය දුර්වලකර තිබෙතැයි තර්ක කරති. මෙකී සාධක අතරින් ඉහළින් ම සිටින්නේ ප්‍රධාන වශයෙන් සිංහල තරුණයන් අතර සහ ද්‍රවිඩ ජාතිවාදය පිටුදැකීම

පිණිස එල්ටීටීඊ යට එරෙහි දිගු කාලීන සිවිල් යුද්ධය යන ප්‍රධාන කැරළිකාර තත්වයන් ද්විත්වයයි.

යුද්ධයේ සහ හදිසි නීති රෙගුලාසි සම්බන්ධයෙන් නොනැවතී පවත්නා විශ්වාසයේ ප්‍රතිඵලයක් ලෙස, උත්තර්ජනයන් සහ ඇතැම් අවස්ථාවලදී දේශීය මාධ්‍යවේදීන් හා කර්තෘවරුන් ඝාතනය කිරීම සමග එක්ව රාජ්‍යය සහ පුද්ගලික මාධ්‍ය අතර එදිරිවාදිකමක් වර්ධනය වෙමින් තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා නෛතික රාමුව මාධ්‍ය ආයතනයන් ට එරෙහි වූවක් බවට හැරී තිබෙන අතර, මාධ්‍ය නිදහසේ සෝදාපාළුව සඳහා දායක වී තිබේ. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නීති සහ මාධ්‍ය නීති ප්‍රතිසංස්කරණ සෙසු රටවල් ගණනාවක විවාදයට බඳුන් ව පවතින අතර, මේ තත්වය ඉන්දියාව සමගත් දකුණු ආසියානු කලාපයෙන් පිටත රටවල් සමගත් කතුවරු සන්සන්දනය කරති. දෘඩ ආරක්ෂක නීති විසින් මාධ්‍යකරුවන් ට එරෙහි අධිකරණය ට බාහිර ඝාතන, ප්‍රචණ්ඩ ක්‍රියා සහ සැබෑ පුද්ගලික තර්ජනවල ස්වරූපයෙන් ස්වයං වාරණයක් පනවා තිබේ. පෙර කී බලපෑම් සම්බන්ධයෙන් කිසිදු අධිකාරියක් වගකීම නොගන්නා අතර විමර්ශනය කිරීමක් පවා නොකෙරේ.

2009 වර්ෂයේ එල්ටීටීඊ යට එරෙහි යුද්ධය අවසාන වීම නැවුම් ආරම්භයක් පිළිබඳ බලාපොරොත්තුවක් ගෙන ආවේය. 'පරමාදර්ශීය ලෙස, ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ වර්ෂයන් ප්‍රජාවන් අතර සංහිඳියාවට උරදෙන ස්වකීය හැකියාවන් සමග උද්දීප්ත වූ මාධ්‍ය සංස්කෘතියක ආරම්භය සඳහා පෙරටුව යා යුතු වන්නේ' යැයි පින්ටෝ-ජයවර්ධන සහ ගෙහාන් ගුණතිලක ලියති. යථාර්ථය තුළ, ශ්‍රී ලංකාවේ මාධ්‍යය 'පමණ ඉක්මවා බලවත්' තත්වයක ස්වරූපයෙන් සිය ඒකාබද්ධතාවය හා ස්වාධීනත්වය හා සම්ප්‍රදායික සංවරණයන් හා තුලනයන් දුර්වල වීම ප්‍රතිෂ්ඨාපනය කර ගැනීම සඳහා අරගල කර තිබේ.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නීති ප්‍රතිසංස්කරණය ට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තිය නිරන්තරයෙන් ම උපයෝගීතාවය විසින් මෙහෙයවා ඇත. මාධ්‍ය කර්මාන්තයේ ආයතන සහ සමකාලීන ව බලයේ සිටින ආණ්ඩුව අතර කේවල්කිරීමේ ක්‍රියාවලියක් පවතියි. කල් ඉකුත් වූ නීති සහ රෙගුලාසි වෘත්තීය මාධ්‍යවේදය ට බාධාවන් ය. සාපරාධී අපහාසය ප්‍රතිසංස්කරණ මානයක් සාර්ථක වූ එක් ක්ෂේත්‍රයකි. නමුත් කුඩා ප්‍රගතියක් පමණක් පවතින- ප්‍රතිසංස්කරණය කළ යුතු ක්ෂේත්‍රයන් තිබේ. ස්වාධීන විකාශන නියාමකයක්

නිර්මාණය කිරීම, අධිකරණය ට අපහාස කිරීම සහ තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධ ව ව්‍යවස්ථා සම්මත කර ගැනීම මෙයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිසංස්කරණ මුලපිරීම්, 1996 'ආර්.කේ.ඩබ්. ගුණසේකර කමිටු වාර්තාව' ලෙස නිරන්තරයෙන් හැඳින්වෙන වාර්තාව සමග විශාල වශයෙන් බැඳී පවතියි. ආණ්ඩුව විසින් පත්කළ මෙම පාර්ලිමේන්තු කමිටුව, 'ද්වීපක්ෂ එළඹුමක්' භාවිතා කරමින් 'මාධ්‍ය සඳහා ව්‍යවස්ථාදායක හා නියාමන රාමුවක්' හඳුන්වා දුන් අතර, ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය ව තිබෙන ක්ෂේත්‍රයන් හඳුනාගත්තේය. දහසය වසරකට පසුව ද එහි නිර්දේශවලින් රාශියක් ක්‍රියාව ට නැංවී නැත. නමුත් මාධ්‍ය ප්‍රතිසංස්කරණ ප්‍රගතිශීලී ලෙස සලකා බැලීමේ සන්ධිස්ථානයක් එයින් සනිටුහන් වන අතර, (තිලක් ජයරත්න හා සරත් කැල්ලපත නිරීක්ෂණය කරන ආකාරයට) වෑයමෙන් සිදුකරන ලද ලිහිල් කිරීම් හා මාධ්‍ය සම්බන්ධ සීමාවන් දෘඩ කරන ලද අවස්ථාගත කාලපරිච්ඡේදයන් නොතකා, එකී නිර්දේශයන් දේශපාලන වාතාවරණයක් තුළදී වුව අදාළ ව පැවතී ඇත. භාෂණයේ  සහ ප්‍රකාශනයේ නිදහස සුරැකීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පමණක් ප්‍රමාණවත් නොවන්නේ යැයි කමිටුව තර්ක කළේය. විවෘත රජයේ ප්‍රතිපත්තිය තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනතකින් සුරක්ෂණය විය යුතු ය. මෙකී නිර්දේශයන් සහ කමිටු වාර්තාවෙන් වසර ගණනාවක් තුළ ඒවා ට ප්‍රතිචාර ලෙස සිදුකළ මුලපිරීම් ජයවර්ධන සහ ගුණතිලක ගේ පත්‍රිකාව මගින් විමසා බලයි.

විද්‍යුත් මාධ්‍යය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව, රාජ්‍ය පාලනය සහිත විද්‍යුත් මාධ්‍යය තුළ ජ්‍යෙෂ්ඨ විකාශකයන් වශයෙන් කටයුතු කළ තිලක් ජයරත්න හා සරත් කැල්ලපත ගේ ස්වයං අත්දැකීම් වලින් ලද ප්‍රායෝගික පර්යාලෝකයන් මත පදනම් වූ ඒවා ය. ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍යයේ ඉතිහාසය, එහි යටත්විජිත මූලයන් හා එය ට මුක්කු ගැසූ සහ ඇතැම් අවස්ථාවලදී එහි සංවර්ධනය ට බාධා සිදුකළ පශ්චාත් ස්වාධීන දේශපාලන සන්දර්භය පිළිබඳ ඔවුහු සමාලෝචනයක යෙදෙති. මාධ්‍ය භාවිතය පිළිබඳ සිය සාකච්ඡාව ට ඔවුන් සෛද්ධාන්තික සැකිල්ලක් සපයන නමුත්, මුද්‍රිත මාධ්‍යය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවේදී දීර්ඝ වශයෙන් ආවරණය කර තිබෙන නෛතික ගැටලු සඳහා ඔවුන් ලබාදී තිබෙන්නේ අඩු බරකි. 1971 සිට කැරළිකාර තත්වයන් හා අරගලයන් මාධ්‍ය සංවර්ධනය සඳහා ප්‍රධාන බලපෑමක් සිදුකර තිබෙනුයේ, ආණ්ඩුවේ උපකරණයක් වශයෙන් මෙන්ම කැරළිකාර තත්වයන්ගේ බලපෑම ට හා පාලනයට නතු විණි නම් රාජ්‍යයේ ස්ථාවරත්වය

ට තර්ජනයක් ද වන පරිදි දෙයාකාරයෙන් ම අවධානය දිනා ගනිමිනි. මේ උභතෝකෝටිකයේ වාසිය දේශපාලන පක්ෂ විසින් ගන්නේ යැයි තර්ක කෙරේ. විරුද්ධ පක්ෂයේ සිටියදී ඔවුහු මාධ්‍ය අයිතීන් හා ප්‍රතිසංස්කරණ ප්‍රතිඥාවන් වෙනුවෙන් කැළඹිලි ඇති කරති. නමුත් බලයේ සිටින විට මෙම පක්ෂ විසින් ම සිය ස්ථාවර වෙනස් කෙරේ.

1980 හා 1990 දශකවල මාධ්‍ය වාතාවරණයේ සිදුවූ-ඇතැම්විට ධනාත්මක හා ඇතැම්විට සෘණාත්මක වෙනස්කම් ගැන ද කතුවරු විමසා බලති. 1994 දී ශ්‍රී ලංකා ගුවන්විදුලිය විසින් නව අධ්‍යාපන සේවය දීර්ඝ වශයෙන් සලකා බැලෙන්නේ ශ්‍රී ලාංකික විකාශනය වෙත හොඳ ම භාවිතයන් හා සම්ප්‍රදායන් දීර්ඝකිරීමේ මුලපිරීමක් ලෙස වුවද, ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පමණ ඉක්මවා විවේචනය කරන බැව් පෙනී ගිය විට හිටි අඩියේ අවලංගු කරන ලදී. පර්යේෂණ පත්‍රිකාවේ කතුවරුන්ගෙන් එක් අයෙක් මෙම නව අධ්‍යාපන සේවය (NES) සකස් කිරීම සඳහා සමීප ව සම්බන්ධ වූවෙක් වන අතර, වැරදී ගියේ කුමක් ද සහ එසේ වූයේ මන්ද යන්න සම්බන්ධයෙන් ප්‍රබල පෞද්ගලික දෘෂ්ටිකෝණයක් ගෙන හැර දක්වයි. රාජ්‍ය විකාශකයාගේ කාර්ය මණ්ඩලය ප්‍රබල ලෙස වෘත්තීය සමිතිකරණය ට ලක් ව සිටි අතර මහජන සුබසිද්ධියේ දොරටුපාලයාගේ භූමිකාව රඟපෑ යුත්තේ කවුද යන්න සම්බන්ධයෙන් වෘත්තීය සමිති හා පරිපාලනය අතර තරගයක් පැවතියේ යැයි කතුවරු තර්ක කරති. අපර ප්‍රතිඵලයක් වූ ආණ්ඩුව හා මාධ්‍ය අතර 'සී සෝ අදියරේ' සම්බන්ධතාවය විසින් මාධ්‍ය පාලනය සහ මාධ්‍ය ලිබරල්කරණය වෙනුවෙන් පැවති පීඩනය ප්‍රදර්ශනය කෙරුණා පමණක් නොව අරගලයන් පැවති සමයන්ගේ පවා, ආණ්ඩුව තමන්ගේ පාර්ශවයෙන් පිළිගැනීම ට කැමති වූ පරිදි, නිදහස් මාධ්‍යය වෙත සමාජයේ කැපී පෙනෙන පිළිගැනීමක් ලැබී තිබිණි.

මාධ්‍ය නිදහස ආරක්ෂා කළ සහ සීමා කළ ආණ්ඩුවේ ප්‍රධානීන් දෙදෙනෙකුගේ කාර්යයභාරය කතුවරු සන්සන්දනය කරති. 2002-2004 සමයේදී ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා ප්‍රතිවිරුද්ධ පක්ෂවලින් පත්වූ-අපූර්ව නමුත් කෙටිකාලීන 'සහවාරී' ආණ්ඩුවක් යටතේ මාධ්‍ය නිදහස සඳහා කැපවීමක් ලෙස පෙනුණු දේශපාලන විරුද්ධවාදිත්වයෙන් රනිල් වික්‍රමසිංහ ප්‍රේරණය වූයේ යැයි කතුවරු තර්ක කළද මාධ්‍ය නිදහස වැඩිදියුණු කිරීම සඳහා රනිල් වික්‍රමසිංහ කැපී පෙනෙන පියවර කිහිපයක් ගත්තේය. සාපරාධී අපහාස පනත අවලංගු කිරීම ඒ අතර වේ.

වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ පිළිබඳ වාර්තාව, සිංහල බෞද්ධ ජාතිවාදී මතයන්ගෙන් යුත් ඉතා වෙනස් ඡන්ද දායක කොට්ඨාසයක් වෙත සිය අධිකාරිය සහබද්ධ කරමින් පවතින්නකි. එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික ක්‍රම වෙත අඩු ආකර්ෂණීය භාවයක් ලෙස පරමාදර්ශීයව ම පෙනී ගියත් එකී කොට්ඨාසය ට එය පෙනී යන්නේ ලිබරල් සහ විවෘත මාධ්‍යයක් ලෙසිනි. ද්‍රවිඩ ඊලාම් කොටි සංවිධානයේ පරාජයෙන් සහ දිගු කලක් මුළුල්ලේ පැවති ද්‍රවිඩ බෙදුම්වාදී කැරලිකාර තත්වය අවසාන වීමෙන් පසුව පවා දැඩි මාධ්‍ය සීමාකරණයන් තවදුරටත් පවත්වාගෙන යාම දේශීය හා අන්තර්ජාතික වශයෙන් විශේෂ විවේචනයක ට ලක් ව තිබේ. ජනමාධ්‍යවේදීන් ට වාර්තා කළ හැක්කේ, පාලක පක්ෂය විසින් ප්‍රසිද්ධ කිරීමට බලාපොරොත්තු වන දෙය ට ළඟින් බැඳී ඇති දේ පමණක් යැයි ක්‍රියාකාරීන් තර්ක කරන තරමට වාර්තාකරණ වාතාවරණය තවදුරටත් අනාරක්ෂිත ව පවතියි.

සමාජය සංවිධානය වන රටාව හා ආර්ථික තීරණ ගනු ලබන රටාව සම්බන්ධයෙන් මාධ්‍ය හිමිකාරිත්වය තීරණාත්මක යැයි කතුවරු තර්ක කරති. ශ්‍රී ලංකාවේ පුද්ගලික විද්‍යුත් මාධ්‍ය හිමි ව තිබෙන්නේ සිය පුළුල් ව්‍යාපාරික ජාල උපද්‍රවකාරී තත්වයකට මුහුණ දී තිබෙන සහ මහජන සුබසිද්ධිය වෙත නාභිගත නොවූ ජනතාවට ය. අදහස් සහ මත දැක්වීම්වල වැඩි විවිධත්වයක් ලබාගැනීමට නම් සම්පූර්ණ මාධ්‍ය හිමිකාරත්වයේ සැකිල්ල දෙස ම නැවුම් ඇසකින් බැලිය යුතු යැයි ඔවුහු තර්ක කරති.

### *සිවිල් සමාජය සහ මාධ්‍යය*

සන්නද්ධ අරගලයේ දීර්ඝ කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ හදිසි නීති සහ සීමාවන් විසින් මාධ්‍ය ප්‍රතිසංස්කරණය පිළිබඳ විවාදය අධෛර්යමත් කර නැත. වසර ගණනාවක් මුළුල්ලේ, මාධ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා සහයෝගය පළකිරීම මාධ්‍යවේදය පිළිබඳ නීතිඥයන් හා ලිබරල් ආයතනය පිටස්තර පරමාදර්ශයක් ලෙස නොව ස්වාධීන ව්‍යාපාරයකින් පැනනැගුණු සහ දේශපාලන හා ආර්ථික ස්වයං පාලනයකින් සහයෝගය ලද්දක් ලෙස දුටු සිවිල් සමාජයේ පුළුල් ධාරාවක් විසින් ප්‍රබල ලෙස විදහා දැක්වූ යුගයන් විය.

මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනය වෙත මග පෑදූ 1998 සම්මන්ත්‍රණය, මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් මතය තිරසාර ලෙස

දැක්වුණු අවස්ථාවක් සනිටුහන් කළේය. මාධ්‍ය නිදහස සහතික කරන දීර්ඝ කාලීන රාමුවක් සැපයීම සඳහා වූ එකී කොළඹ ප්‍රකාශන ත්‍රිත්වයේ පළමුවැන්න එය විය. එය, ආණ්ඩුව මාධ්‍ය කෙරෙහි සිය දැඩි ග්‍රහණය තවත් දැඩි කරමින් සිටින්නේ වුවද ස්වකීය නිදහස තරයේ කියාපෑම සඳහා මාධ්‍යය ට ශක්තිමත් ස්ථාවරයක් දැරිය හැකි බව පෙන්වූ මූලික මාධ්‍ය මුලපිරීමක් විය. විද්‍යුත් මාධ්‍ය සඳහා එය, රාජ්‍ය විකාශකයන්ගේ ස්වයං පාලන තත්වයක් අතිශය හදිසියේ විදහා දැක්විය යුතු අවස්ථාවක් විය. නමුත් එය කිසිවිට සිදුනොවීය. සාමාන්‍ය කාලයකදී නම් මෙය ආණ්ඩුව විසින් පිළිගෙන බලගැන්විය යුතුව තිබිණි. කෙසේ නමුත් වර්තමානයේදී වඩා ලිබරල් මාධ්‍ය ප්‍රතිපත්ති රාමුවක් ළඟාකරගැනීමේ අපේක්ෂාව පිළුණු වී ඇති බව පෙනේ.

මාධ්‍ය කර්මාන්තයේ ප්‍රධාන ගැටලුවලට ප්‍රතිචාර දැක්වීම ට රාජ්‍යය මන්දගාමී වුවද "තෝලංගමුව ප්‍රකාශනය" වෙත පර්යේෂණ පත්‍රිකාවන් ද්විත්වය ම සැලකිය යුතු වැදගත්කමක් ලබාදී තිබේ. මෙය, 2005 සැප්තැම්බරයේදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාධ්‍ය ආයතන විසින් මාධ්‍ය ප්‍රඥප්තියක් ඇතිකරගැනීමෙහිලා සිදුකළ මුලපිරීමෙහි ප්‍රතිඵලයක් විය. "මහජන සුබසිද්ධිය සඳහා වගකියන, ආණ්ඩුවෙන් හෝ පක්ෂග්‍රාහී බලපෑම්වලින් හා අතපෙවීම්වලින් ස්වාධීන වෘත්තීය මාධ්‍යවේදයක් ප්‍රජාතන්ත්‍රවාදයේ සංවරණ හා තුලන කේන්ද්‍රය සඳහා අත්‍යාවශ්‍ය කොටසක් යැයි එම ප්‍රඥප්තිය මගින් තරයේ කියා සිටියේය.

එයින් පසුව එළඹුණු වසර වලදී මාධ්‍ය ක්ෂේත්‍රයේ තවත් මුලපිරීමක්, ජාතික සමගිය සඳහා අතිශය වැදගත් ප්‍රතිපත්තිමය ලේඛනයක් හඳුන්වාදෙනු ලැබීය. මෙම වැලිගම ප්‍රකාශනය නිර්දය ලෙස ම මාධ්‍ය ප්‍රතිසංස්කරණ සම්බන්ධ ස්වයං විවේචන එළඹුමක් සහිත ව පනවා ගැනුණකි. ජාතික සමගිය රෝපණය කිරීමේදී මාධ්‍ය වෙත තීරණාත්මක භූමිකාවක් තිබිණි යැයි පොදු එකඟතාවයක් විය. නමුත් බුද්ධිමතුන් විසින් සිදුකරන මාධ්‍ය පිළිබඳ වැඩදායක විවේචන, මාධ්‍ය වෘත්තියේ වඩාත් ධනාත්මක භූමිකාවක් සපයන බව ද මෙම ප්‍රකාශනයේ සඳහන් වේ.

*මාධ්‍ය අධ්‍යාපනය*

මුද්‍රිත මාධ්‍යය සහ විද්‍යුත් මාධ්‍යය පිළිබඳ ලියැවුණු පත්‍රිකා ද්විත්වය ම මගින් ශ්‍රී ලංකාවේ මාධ්‍ය අධ්‍යාපනයේ තත්වය ආමන්ත්‍රණය කරන අතර මාධ්‍ය ඉගැන්වීම සහ අධ්‍යයන ආයතනවලදී සිදුකරන මාධ්‍ය පුහුණුකිරීම් විසින්,

මාධ්‍යය පිළිබඳ අවබෝධය හැඩගන්වා තිබෙන්නේ කෙසේද යන්න විමසා බලයි. තිලක් ජයරත්න හා සරත් කැල්ලපත ගේ පර්යේෂණ පත්‍රිකාව විසින් විෂය මාලාවන්ගේ අන්තර්ගතය විමසා බලන අතර, මාධ්‍ය වෘත්තියෙන් පිටත ප්‍රථම වතාවට 1973 දී කැලනිය සරසවිය විසින් මාධ්‍ය පුහුණුව සහ මාධ්‍ය අධ්‍යයනය වැඩිදියුණු කිරීමේ පටන් විවිධ විශ්ව විද්‍යාල විසින් ඒ සම්බන්ධ ව යොදාගත් එළඹුම් මෙම පත්‍රිකාව විසින් විශ්ලේෂණය කරයි. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අධ්‍යාපනයේ ප්‍රගමනය පැමිණෙනුයේ, රැකියා මූලික පාඨමාලා ඇති කිරීම සඳහා වූ ආණ්ඩුවේ කැමැත්ත සමග ය. ලේඛනයේදී භාෂා භාවිතය ඉගැන්වීම පිණිස පුරෝගාමී සරසවි ආචාර්යවරුන් පාඨමාලා නිර්මාණය කළ අතර, මාධ්‍යය සහ සන්නිවේදනය සඳහා ඔවුන් ලබාදුන්නේ අඩු වටිනාකමකි. එයට පෙර පුහුණුකිරීම් සිදුකරනු ලැබුවේ එක්කෝ මුද්‍රිත මාධ්‍ය ආයතන තුළ, එසේත් නැතිනම් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පුහුණු පාසල (SLBCTI) පිහිටුවීමට මුල්වූ 1960 දශකයේ අග සිට රාජ්‍ය ගුවන් විදුලිය විසිනි.

ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාල තුළ සහ වෘත්තීය පුහුණු ආයතන තුළ ජනමාධ්‍යවේදය සහ මාධ්‍ය අධ්‍යයනය උගැන්වීමේ ක්‍රමවේදයන් පර්යේෂණ පත්‍රිකාවන් ද්විත්වයේදී ම සාකච්ඡා කෙරේ. පින්ටෝ-ජයවර්ධන සහ ගුණතිලක වෙනස් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල තුළ උගැන්වෙන විෂය මාලා විමසා බලන අතර, මාධ්‍ය ප්‍රතිපත්ති සහ නීතිය කෙරෙහි අවධානය යොමුකිරීම සම්බන්ධයෙන් බරපතළ අඩුවක් ඒවායේ තිබෙන බැව් ඉස්මතු කරති. උද්දීප්ත නව පරම්පරාවක් වෘත්තිය ට පිවිසීම ට මං සොයන හෙයින් ඔවුන් තර්ක කරන්නේ, වඩාත් ඵලදායී වෘත්තීය පුහුණුවක සහ මාධ්‍ය නිදහසත් නූතන ගැටලුත් වැඩි වශයෙන් විෂයමාලාවන් ට ඇතුළත් කිරීමේ සැබෑ අවශ්‍යතාවක් පවතින බවයි.

මෙහි වෙන ම කොටසකදී පින්ටෝ-ජයවර්ධන සහ ගුණතිලක, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නීතිය හා මාධ්‍ය ප්‍රතිපත්ති ඉගැන්වීම, ව්‍යාපෘති කාලය තුළදී දකුණු ඉන්දියාවේ මාධ්‍ය ඉගැන්වීමේ ආයතනවල සගයන් සමග ඇය පැවැත්වූ සාකච්ඡාවන් මත පදනම් ව, ඉන්දියාවේ ජනමාධ්‍ය විද්‍යාල සමග සසඳා බලයි. ගතවූ දශක දෙක තුළදී ඉන්දියානු මාධ්‍යයේ සිදුවූ විස්තීරණ වීම එරට මාධ්‍ය අධ්‍යාපනය පරිණාමනයට ලක් කිරීම ට හේතු වූ බව ට ඔවුහු තර්ක කරති. නමුත් විෂයමාලා ප්‍රතිසංස්කරණය ට දැරූ පරිශ්‍රමයන් ට බාධා එල්ල වූ බව ඔවුහු සොයාගනිති. අන්තර්ජාලය පාලනය කිරීම ට අදාළ නීති දැන් විෂයමාලාවන්ගේ වැදගත් කොටසක් බවට පත්ව ඇති හෙයින්,

පාඨමාලාවන්ගේ ව්‍යවස්ථාපිතමය දෘෂ්ටිකෝණයන් ට ලැබී තිබෙන්නේ අඩු වැදගත්කමකි. මාධ්‍ය නීතිය හා ප්‍රතිපත්ති ඉගැන්වීම සහ මානව හිමිකම් අතර සම්බන්ධතාවය ට ලැබී තිබෙනුයේ අඩු ප්‍රමුඛතාවයකි.

සරසවි පාඨමාලාවන්ගේ අන්තර්ගතයේ අනුපිළිවෙළ සහ සිද්ධාන්ත හා ප්‍රායෝගිකත්වය අතර නිවැරදි තුලිතතාවය සොයාගැනීම ට අසීරු වීම පිළිබඳවද කතුවරු සාකච්ඡා කරති. සිද්ධි අධ්‍යයනයන් සම්බන්ධයෙන් නිරන්තරයෙන් ම විදෙස් උදාහරණ ගන්නා අතර නූතනත්වය ට හෝ ඉන්දියාවේ දේශීය මාධ්‍යයට ඒවායේ අදාළත්වයක් නැත. මෙකී පාඨමාලාවන්හිදී මාධ්‍ය නීතිය වෙත එළඹුම අඩුවීම අන්තර්ක්ෂේත්‍ර මිනුමක් බවට පත් ව තිබෙන අතර, මාධ්‍යය සම්බන්ධයෙන් එහි භූමිකාව සහ එහි බලපෑම නිරන්තරයෙන් ගිලිහී ඇත්තා සේ පෙනේ.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ සිය සාකච්ඡාවේදී, තිලක් ජයරත්න සහ සරත් කැල්ලපත මාධ්‍ය අධ්‍යාපනය ට ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීමේ අඩුව පිළිබඳ සිය මතය ඉදිරිපත් කරති. තවද සමස්තයක් වශයෙන් රට දෙස බලනවාට වඩා කර්මාන්තයේ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමුකළ යුතු බැව් අවධාරණය කරති. මාධ්‍ය ගැටලු සම්බන්ධයෙන් සමාජය මුහුණදෙන සැබෑ ගැටලු, වැඩිවශයෙන් විනෝදාස්වාදයට නැඹුරු වී සිටින මාධ්‍යයේදී එතරම් සාකච්ඡා නොකෙරේ. මාධ්‍ය අධ්‍යාපනය වෘත්තීය පුහුණුවෙන් අඩු විය යුතු අතර, මාධ්‍යය සහ සමාජය වෙත ප්‍රත්‍යවේක්ෂණයක්, විවේචනාත්මක එළඹුමක් වැඩි වශයෙන් සිදුකළ යුතු ය. මාධ්‍ය නිදහස වෙත, මානව හිමිකම් ක්‍රියාකාරීන් වෙත, නීති වෘත්තිකයන් වෙත සහ ශ්‍රී ලාංකේය සිවිල් සමාජයේ මේ සම්බන්ධයෙන් විශේෂ උනන්දුවකින් කටයුතු කරන්නන් වෙත මාධ්‍ය අධ්‍යාපනය ඉතා බරපතළ ලෙස සහ තීරණාත්මක ලෙස වැදගත් වන්නේ යැයි ඔවුහු තර්ක කරති.

මෙකී මූලික පර්යේෂණ පත්‍රිකාවන් ට අමතරව, Media Reform Lanka Initiative ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ මාධ්‍ය අධිකාරීන්ගෙන් ලබාගත් සම්මුඛ සාකච්ඡාවන් ඇසුරෙන් පළකළ නිබන්ධනයන් ද සිය වෙබ් අඩවිය වන www.mediareformlanka.com/ හි පළ කර තිබේ. මෙම ව්‍යාපෘතිය විසින් අරමුණු කළ, ශ්‍රී ලංකාවේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයට බලපාන නෛතික හා රෙගුලාසිමය වාතාවරණය පිළිබඳ ශ්‍රී ලාංකේය ලේඛකයන් විසින් සිදුකළ අධිකාරීමය විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ට මෙම

වෙබ් අඩවිය ඉලක්ක කරයි. දකුණු ආසියාවේ අසල්වැසි රටවල් සමග සහ දකුණු ආසියානු කලාපය ට පිටස්තර රටවල මාධ්‍ය අධ්‍යාපනය හා මාධ්‍ය සංවර්ධනය සම්බන්ධ සන්සන්දනාත්මක මතය ක අගය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් වන දැනුවත් භාවය සහ මාධ්‍ය පිළිබඳ දැක්ම අරබයා කතුවරුන් සිය පෘථුල හා ඌනපූරක අත්දැකීම් හා දෘෂ්ටීන් දරති. අදාළ වෘත්තීමය හා ප්‍රජා ගැටලු සහ අවදානම් සහගත ප්‍රතිපත්ති වල වැදගත්කම හා ඒවායේ පරාසය විදහා පාන මූලාශ්‍රමය අංගයන් සපයාලීම ට මෙම විශ්ලේෂණය සහ ලේඛනගත කිරීම මගින් අපේක්ෂා කරයි.

- *එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පොදු රාජ්‍ය මණ්ඩලයීය අධ්‍යයන ආයතනයේ ආචාර්යවරුන් වන* ***ඩේවිඩ් පේජ් සහ විලියම් ක්‍රොව්ලි.***

- *ජ්‍යේෂ්ඨ නීතිඥ සහ Media Reform Lanka Initiative ව්‍යාපෘතියේ ජ්‍යේෂ්ඨ උපදේශිකා* ***කිශාලි පින්ටෝ-ජයවර්ධන.***

## <u>පළමු කොටස</u>

# ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිපත්තිය සහ නීතිය ;

## *මුද්‍රිත මාධ්‍යය ට අදාළ ව නෛතික, කර්මාන්තමය සහ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ*

*කිශාලි පින්ටෝ-ජයවර්ධන* සහ *ගෙහාන් ගුණතිලක* විසිනි.

# 1. හැඳින්වීම

*"අපගේ ස්වාධීනත්වය රඳා පවතින්නේ පුවත්පත් නිදහස මත ය. එය අහිමි නොකර, සීමා කළ නොහැක."*

*-තෝමස් ජෙෆර්සන් (1743-1826)*

*"...සංස්ථාපිත බලය සඳහා විෂ නාශකයකැයි වරෙක සිතූ පුවත්පත් විසින් එය ශක්තිමත් කරන බව වැඩිවශයෙන් පෙනෙන්නට තිබේ. මන්ද යත්, පුවත්පත් වෙත ප්‍රවේශය-එනම් එය ජනමාධ්‍යය වන හෙයින්, බලයේ සෙසු ආකාරයන් මෙන්ම අසමාන ලෙස බෙදාහැරෙන නිසා ය. සැබවින් ම, ප්‍රබලත්වයෙන් හීන වූවන් පිළිබඳ ජනමාධ්‍යවේදය තුළ කිසිවිටෙක කතා නොකරන අතර, ප්‍රබලත්වයෙන් හීනවූවන් කළ කී දෑ ද ඒ තුළ කිසිවිට වාර්තා නොවේ. ජනමාධ්‍යය ඔවුන් වෙත කිසිදා අනුකම්පා සහගත නොවේ. නමුත් ආශ්‍රිත කරුණු සියල්ල ඔවුන් ට එරෙහි ව පවතිනුයේ අපගේ සමාජය තුළ රහස්‍ය භාවය (සරල නොවුවද) සමග එක් ව සෙසු විනාශකාරී බලයන් ද කැටුව යන පුවත්පත් ද විනාශකාරී බලයකින් යුතු වන හෙයිනි."*

*-ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනමාධ්‍යය, කේම්බ්‍රිජ් සරසවි මුද්‍රණාලය, 1990,*
*මුද්‍රණය: ලිටෙන්බර්ග්, පිටු 102-105*

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ සහ මාධ්‍ය ස්වාධීනත්වයේ නිර්ගමනය, වර්ධනය (සහ දැන් දැකියහැකි තත්වය) සැලකියයුතු පිරිහීමක් පෙන්නුම් කරන අතර, එම තත්වය විචලනය වූ ඉතිහාසයකින් යුතු ය. නිදහසින් පසු මුල් වර්ෂවල පැවති දක්ෂ සහ කුසලතාපූර්ණ ජනමාධ්‍යවේදය සහ පුවත්පත් කියවන මහජනතාවගේ පුරසාරම් බෑ ඉහළ සාක්ෂරතා අගය අනුව සැලකීමේදී ශ්‍රී ලංකාව දීප්තිමත් ව සහ ප්‍රබල ලෙස දීප්තිමත් වූවා විය යුතු ය. නමුත් මෙකී දැල්වීම ශක්තිය ඉඳහිට පමණක් එක්රැස්කර ගනිමින් සටපට හඬ නගමින් චංචල වෙමින් මන්ද දීප්තියකින් යුතු වූවා පමණක්

වන අතර, විශේෂයෙන් ම ගතවූ දශකය තුළ එය ඉතා කලාතුරකින් පමණක් ශක්තිය එක්රැස්කර ගනිමින් සියුම් ඉලක්කයක් වෙත යොමුවූ-සැලෙන ආලෝකයක් දක්වා පිරිහිණි.

2009 වර්ෂයේ මැයි මස සක්‍රිය යුද්ධය අවසන් වන තෙක් ම ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) විසින් සිදුකළ සන්නද්ධ අරගලය හේතුවෙන් ඇති වූ උතුරු නැගෙනහිර යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස ජනනය වූ රාජ්‍ය ප්‍රචණ්ඩත්වය 2009 වර්ෂයේ මැයි මස සක්‍රිය යුද්ධය අවසන් වන තෙක් පැවති නමුත්, හැත්තෑව හා අසූව දශකවලදී ප්‍රධාන වශයෙන් ම දකුණේ සිංහල බහුතර තරුණ සන්නද්ධ භටයන් විසින් ඇති කළ මේ හා සමාන ප්‍රචණ්ඩකාරී කැරළි විසින් ශ්‍රී ලංකාවේ මාධ්‍ය නීතියේ සහ මාධ්‍ය ප්‍රතිපත්තියේ සිද්ධාන්ත හා භාවිතය රාමුගත කර තිබේ. රජය හා පෞද්ගලික මාධ්‍ය අතර එදිරිවාදී කම් වඩ වඩාත් ගැඹුරු වන අතරතුර, ජනමාධ්‍යවේදීන් හා කර්තෘවරුන් ට තර්ජනය කිරීම, බිය ගැන්වීම සහ ඇතැම් අවස්ථාවලදී සිය රැකියාව සඳහා යමින් සිටින අතරතුර, රජයේ මෙන්ම රාජ්‍ය නොවන කාරකයන්ගේ  දැනුවත්භාවය මත මරණය ට පත් ව තිබේ. සෙසු නීතීන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා රාජ්‍ය න්‍යායපත්‍රය ට අනුව අවනත වීම ට මාධ්‍යය ට බලකිරීම සඳහා යොදාගෙන තිබේ. අදහස් ප්‍රකාශ කිරීම, මත ප්‍රකාශනය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය මර්දනය කිරීම සඳහා, දකුණු ආසියාවේ සෙසු දැවැන්තයන් ට සාපේක්ෂ ව ප්‍රමාණයෙන් කුඩා අවකාශයකට සීමා වී තිබෙන මාධ්‍ය සංස්කෘතිය, මෙබඳු අත්‍යාධික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අගතිගාමී ලෙස යොමුව තිබේ.

නියත වශයෙන් ම පශ්චාත් යුධ කාලපරිච්ඡේදය, ප්‍රජාවන් අතර සාමදානය හා සංහිඳියාව ට දිරි දීම සඳහා සියලු ශක්නුතාවයන්ගෙන් යුත් දිදුළන මාධ්‍ය සංස්කෘතික ඇරඹුමක් වෙත පෙරගමන්කරුවෙකු විය යුතු වුවද, ඒ වෙනුවට මුළුමනින් ම පාහේ සිදු ව ඇත්තේ එහි විලෝමයයි. පමණ ඉක්මවා බලවත් වූ රාජ්‍යයක් විසින් මැඩ පවත්වනු ලැබූ සහ අති ප්‍රබල ලෙස 'වෙව්ලුවා දැමූ' සහ බලය අයුතු ලෙස භාවිතා කිරීමට එරෙහි ව චිරාගත ලෙස ව්‍යවස්ථානුකූල වූ සංවරණ හා තුලනයන් බොහෝ දුරක ට නිෂේදනය කර තිබියදී ශ්‍රී ලංකාවේ මාධ්‍ය සිය සමෝධානිතභාවය (අවංක භාවය) හා නිදහස අත් නොහැර තබාගැනීම සඳහා අරගල කර තිබේ. ඇස් පනා පිට පෙනෙන ආණ්ඩුවේ වාරණය ට වඩා ස්වයං වාරණයේ භාවිතයන්, මාධ්‍යයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් වඩාත් දැඩි තර්ජනයක් මතු කරමින් පවතියි. රාජ්‍ය මාධ්‍ය සහ රාජ්‍ය මාධ්‍ය හා

පෞද්ගලික මාධ්‍ය අතර පවතින දැඩි ආතතිමය ස්වභාවය රාජ්‍ය මාධ්‍ය විසින් දිගින් දිගට ම ක්‍රියාත්මක කරමින් සිටින්නේ (විකාශන හා මුද්‍රිත මාධ්‍ය යන දෙඅංශයෙන්ම) පවතින රජයේ පූර්ණ අනුමැතිය ලබමිනි. මේ අතර මාධ්‍ය කර්මාන්තය තුළ හා පුලුල් මහජන අවකාශය තුළ තමන්ගේ හෘදය සාක්ෂිය පිරික්සා බැලීමේ ව්‍යායාමය ඉහළ ගොස් තිබෙනුයේ, ආණ්ඩුවේ සන්දර්භය තුළ පමණක් නොව කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය වෙත එල්ල වන ව්‍යාපාරික අභියෝගයන් වෙත ද පුද්ගලික මාධ්‍යයන් සැබෑ වශයෙන් වෘත්තීය කිරීම සඳහා ඒවා ස්වාධීන කරන්නේ කෙසේද යන්න පිළිබඳ ව ය.

මූලික වශයෙන් මුද්‍රිත මාධ්‍යය කෙරෙහි කේන්ද්‍රගත වෙමින් මාධ්‍ය ප්‍රතිපත්තිය හා නීති ප්‍රතිසංස්කරණවලට අදාළ ගැටලු ගණනාවක් මෙම කොටසේදී සාකච්ඡා කෙරේ. පැහැදිලි සහ වෙන් වෙන් ව හඳුනා ගත හැකි පර්යාලෝකයන් තුනක් මෙම විශ්ලේෂණය ට ඇතුළත් වේ. එනම් නෛතික, ආයතනයික සහ අධ්‍යාපනික වශයෙනි. සාකකච්ඡාවේ අරමුණ වන්නේ, ප්‍රතිසංස්කරණ වඩාත් ම අවශ්‍ය ව තිබෙන්නේ කුමන තැන්හි ද යන්න වඩාත් හොඳින් වටහා ගැනීම සඳහා සහ මාධ්‍ය අධ්‍යාපනය හා මාධ්‍ය පුහුණුව ඇතුලු ක්ෂේත්‍රයන් වල එබඳු ප්‍රතිසංස්කරණ වලින් උපරිමය ලබාගත හැක්කේ කෙසේද යන්න වටහාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යය ක්‍රියාත්මක වන රාමුව විමසා බැලීමයි. මේ අනුව, රටේ මාධ්‍ය හැසිරීම පුලුල් ලෙස අර්ථ දක්වන ශ්‍රී ලංකාවේ මාධ්‍ය කර්මාන්තයේ වඩාත් ම ප්‍රකට ව පෙනෙන ලක්ෂණවලින් ඇතැමක් සාකච්ඡා කිරීම මගින් මේ සාකච්ඡාව ආරම්භ කරමු.

මීළඟට රජය හා සිවිල් සමාජ ක්‍රියාකාරීන් යන දෙපිරිස ම විසින් මීට පෙර සිදුකළ ප්‍රතිසංස්කරණ පරිශ්‍රමයන් මෙම පත්‍රිකාව විසින් සලකා බැලෙනුයේ නැවතත් මුද්‍රිත මාධ්‍යය ට ප්‍රමුඛත්වය ලබාදෙන නමුත් ඒ සමග ම සාකච්ඡාවේ පුළුල් සහ වැදගත් කරුණු යෝග්‍ය පරිදි හුවා දැක්වීම සඳහා අවශ්‍ය පරිදි විද්‍යුත් මාධ්‍ය ප්‍රතිසංස්කරණ ද සලකා බලමිනි. එබඳු ප්‍රතිසංස්කරණ පරිශ්‍රමයන් සවිස්තරාත්මක ව දක්වනුයේ ශ්‍රී ලංකා මාධ්‍යයේ වර්තමාන තත්වය සන්දර්භානුගත කිරීම හා ඒවායේ සංවර්ධනයේ දළ තත්වය අර්ථ දැක්වීම සඳහා ය. අතීතයේ සිදුකළ සාර්ථක හා අසාර්ථක ප්‍රතිසංස්කරණ පරිශ්‍රමයන්

එක ළඟ තබා විමසා බැලීමෙන් අනතුරුව මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ශ්‍රී ලාංකේය මාධ්‍ය අද දවසේ මුහුණ දී සිටින ගැටලු සාකච්ඡා කෙරෙයි. මෙම විශේෂිත කොටස මගින් අද දිනයේ මාධ්‍ය කර්මාන්තය සහ මාධ්‍ය වෘත්තිය ට දිගින් දිගට ම අභියෝග කරන ගැටලු විදහා දක්වන්නේ අනාගත ප්‍රතිසංස්කරණ පරිශ්‍රමයන්හිදී ප්‍රමුඛතාවය ලබාදීම ට අදහස් කරන දේ බලාපොරොත්තු සහගත ලෙස විදහා දක්වමිනි. අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ මාධ්‍ය අධ්‍යාපනය, මාධ්‍ය වෘත්තිය සමග එහි සම්බන්ධතාවය හා ප්‍රතිසංස්කරණ පරිශ්‍රමයන් වෙත එහි බලපෑම අපි විමසා බලමු.

මෙම විශ්ලේෂණයේ ඇතුළත් නිරීක්ෂණ හා නිගමන පෝෂණය කිරීම පිණිස ප්‍රකාශිත පොත්පත් හා ශාස්ත්‍රීය ලේඛන මූලික වශයෙන් යොදාගන්නා අතරම ප්‍රකාශකයන්, කර්තෘවරුන්, ජනමාධ්‍යවේදීන්, ස්වයං නියාමකයන්, මාධ්‍ය අධ්‍යාපනඥයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලින් මෙන්ම ශ්‍රී ලංකාවේ විද්වත් මාධ්‍යකරුවන් සමග සිදුකළ සංවාදයන්ගෙන් ද එය ඌනපූරණය වේ.

## 3.3. 1996 සිට සිදුකළ මාධ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ සමාලෝචනයක්

ආර්.කේ.ඩබ්ලිව්. ගුණසේකර කමිටු වාර්තාවෙන් පසු ගතවූ අවුරුදු 15 තුළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය ට මූලික ප්‍රතිසංස්කරණ මුලපිරීම් ගණනාවක් ඇතුළත් විය. මෙකී මුලපිරීම් සමහරකගේ සාර්ථකත්වය හා අසාර්ථකත්වය විමසා බැලීම හා ඒ පිළිබඳ තක්සේරු කිරීම මෙම කොටසේදී සිදුකෙරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදුකිරීම සඳහා ගත් උත්සාහයන් ද මෙයට ඇතුළත් වේ. මාධ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ මුල්කාලීන උපදේශනයන් ප්‍රධාන වශයෙන් නෛතික ප්‍රතිසංස්කරණ වෙත කේන්ද්‍රගත වූ බව පෙනේ. මෙහිදී *වෙනත් කරුණු අතර*, ස්වාධීන නියාමන යාන්ත්‍රණ, අධිකරණය ට අපහාස කිරීම සම්බන්ධයෙන් වඩා හොඳ නීති සහ විශේෂිත වූ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක් ගෙන ඒම පිළිබඳ අවධානය යොමු කෙරිණි. මෙයින් ඉදිරියට විදහා දැක්වෙන පරිදි, මෙකී මුලපිරීම්වලින් බහුතරය තවමත් සිය අරමුණු වලට ළඟා වී නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මාධ්‍ය කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍රය ඇතුළු දෙස ට යොමුවූවක් බවට පත් ව තිබෙන්නේ මාධ්‍ය ප්‍රමිතීන්, මාධ්‍යයේ වෘත්තීයභාවය සහ ආචාරධර්ම වල වැඩිදියුණුවීම් ඉල්ලා සිටිමිනි. පුවත්පත් පැමිණිලි කොමිසම වැනි ආයතන පිහිටුවීම හා නව චර්යා පද්ධතියක් පුළුල් පිළිගැනීමක් හා කීර්තියක් ලබාගැනීම මගින් මෙකී පරිශ්‍රමයන් සාර්ථක වී තිබේ. කෙසේ නමුත් ආයතනයික මට්ටමෙන් ඇති වූ වැඩිදියුණු වීම් තිබියදී, සම්පත් හිඟතාවය වැනි ක්‍රියාත්මක භාවය සම්බන්ධ ගැටලු තවදුරටත් බලපැවැත්වෙයි.

අවසාන වශයෙන්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සලකා බැලේ. සෑහෙන තරමේ ප්‍රමාදයකින් පසු-වෘත්තියේ ගුණාත්මය ට දැඩි ලෙස බලපාන තරගකාරිත්වය හා කුශලතාවයන් පිළිබඳ මූලික අභියෝගයන් ට මාධ්‍ය මුහුණ දී සිටින බව ප්‍රතිසංස්කරණවාදීන් වටහාගෙන ඇති බව පෙනේ. එසේම, වෘත්තියේ පෙරගමන්කරුවන් ඔවුන් ට සපයා ඇති අවකාශය තුළ තමන් ට කළ හැකි උපරිමය කිරීම ට අපොහොසත් වන්නේ නම් නෛතික හා ආයතනයික මට්ටමෙන් සිදුවන මහා දියුණුවක් අරුත් සුන් වන බව ද ඔවුන් වටහාගෙන ඇත්තා සේ පෙනේ. ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍රයේ මෙකී අධ්‍යාපනික අංශය ඇතැම්විට අඩුවෙන් ම සංවර්ධනය වූ හා වෙනම

විශ්ලේෂණයක් අවශ්‍ය කර තිබෙන කොටසක් ද විය හැකිය. මේ පිළිබඳ මෙම වාර්තාවේ අවසන් පරිච්ඡේදයේදී සලකා බලයි. මේ අනුව පහත දැක්වෙන සමාලෝචනය මගින් ආමන්ත්‍රණය කෙරෙනුයේ ගතවූ දශක දෙක තුළ හඳුන්වාදුන් නෛතික හා ආයතනයික ප්‍රතිසංස්කරණ පිළිබඳ පමණි.

# තුන්වන කොටස

# නිගමනය, නිරීක්ෂණ සහ යෝජනා

දුර්ලභ මාධ්‍යයක් වන හෙයින්, විකාශන ධාරාවට අදාළ නියාමනයන් හැරුණු විට විද්‍යුත් මාධ්‍යය පාලනය හා නියාමනය ට උත්සාහ කරන නීති අත්‍යවශ්‍ය නොවේ. නිදහස්, ස්වාධීන සහ බහුවිධ මාධ්‍ය පාලන තන්ත්‍රයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වයං නියාමනය යෝග්‍ය වේ. නිදහස් හා ස්වාධීන පරිසරයක් හඟවාලනුයේ නීති නොමැති කම විසිනි. බොහෝ බටහිර රටවල මෙබඳු නීති නැත. තවදුරටත්, ඇතැම් ආසියාතික රටවල රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ම මෙබඳු අයිතීන් සුරක්ෂණය කර තිබේ. නමුත් තවමත් පාලකයෝ 'ප්‍රවෘත්ති හිරකරගෙන සිටීමට' සමත් ව තිබෙනුයේ ගැටලුවේ තවත් මානයක් තිබෙන බව දක්වාලමිනි. මේ සම්බන්ධයේදී, තොරතුරු දැනගැනීමේ අයිතිය අත්හළ නොහැක්කක් ද යන ගැටලුව මතුවෙයි.

2005 තෝලංගමුව ප්‍රඥප්තිය[1] ශ්‍රී ලංකා මාධ්‍යයේ සාමූහික පරිශ්‍රමයක් සහ බිම් මට්මට පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් එතුළ අන්තර්ගත වන නිසා සහ එය ප්‍රජාතන්ත්‍රවාදී හා බහුවිධ මාධ්‍ය සංස්කෘතියක් මෙන්ම ශ්‍රී ලංකාවේ මාධ්‍ය හා ජනමාධ්‍යවේදයේ වෘත්තීය හා සමාජයීය අයිතිවාසිකම් සඳහා ද පෙනී සිටින හෙයින් එය මාධ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා හොඳ ආරම්භක ස්ථානයක් යැයි අපි විශ්වාස කරමු. 'සාධාරණ, සමතුලිත සහ ස්වාධීන මාධ්‍යයක් යහ පාලනය, බලාත්මක මහජන පරිපාලනය සඳහා අත්‍යවශ්‍ය වන බව ද 'මහජන සුබසිද්ධිය සඳහා වගකියන, ආණ්ඩුවෙන් හෝ පක්ෂග්‍රාහිත්වය සහ බලපෑම් වලින් ස්වාධීන වෘත්තීය මාධ්‍යයක්

---

[1] ප්‍රජාතන්ත්‍රීය හා බහුවිධ මාධ්‍ය සංස්කෘතියක් සහ ශ්‍රී ලංකාවේ මාධ්‍ය හා සන්නිවේදනය සඳහා සමාජයීය හා වෘත්තීය අයිතිවාසිකම් සඳහා වන ප්‍රඥප්තිය, 2005 සැප්තැම්බර් 9-11 දිනවල තෝලංගමුවේදී ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් විසින් ඒකමතික ව ප්‍රකාශ කළ පරිදි.

ප්‍රජාතන්ත්‍රවාදයේ සංවරණයන් හා තුලනයන් මාලාවන්ගේ කේන්ද්‍රයේ අතිශය වැදගත් අංගයක් බව' ද එමගින් නිශ්චය කරයි.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදය හා මාධ්‍යයේ සිද්ධාන්තය ට, මාධ්‍යයේ ප්‍රචාරණ විධිය කුමක් වුවත් එය භූගෝලීය, වාර්ගික සම්භවයන්, ආගමික විශ්වාසයන් හෝ භාෂාවන් මත පදනම් වුවද එය ස්වාධීන, අගති රහිත සහ සියලු ප්‍රජාවන් අතර හා තුළ පූර්ණ ප්‍රජාතාන්ත්‍රික හුවමාරුවක් ඇති කරවන මතයක විවිධත්වය විදහාදක්වන්නක් විය යුතුය යන කරුණ විසින් මගපෙන්විය යුතු ය.

මේ හා සමානව ම, නෛතික ව බලාත්මක කළ හැකි සේවක අයිතීන් හා කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය හා ජනමාධ්‍යවේදී වෘත්තිය සඳහා පිළිගැනීමක් සහතික කරන යෝග්‍ය රෙගුලාසි හරහා විනීත ලෙස ක්‍රියාව කිරීම හා වෘත්තීය තත්වයන් සඳහා ගරුකළ යුතු බව ට ද අපි එකඟ වෙමු.

එසේම, ජනමාධවේදයේ ආචාර ධර්ම පවතිනුයේ එබඳු ආචාරධර්ම පද්ධතීන් නිර්මාණය කිරීම සඳහා වගකිවයුතු මාධ්‍ය වෘත්තිකයන් සහ විශ්වසනීය හා වගකිවයුතු ස්වයං නියාමන පද්ධති ස්ථාපනය කළ යුත්තන් වෙත ය. වැඩකරන ජනමාධ්‍යවේදීන්ගේ වගකීම සම්බන්ධ ගැටලුවලට, නම් වශයෙන් සඳහන් කරන්නේ නම්, තොරතුරු එක්රැස් කිරීම, සූදානම් කිරීම, තෝරාගැනීම හා තොරතුරු සම්ප්‍රේෂණය සම්බන්ධ ව සාමාන්‍ය නීතියෙන් ඔබ්බෙහි වූ ව්‍යවස්ථාකරණයන් නොමැති විය යුතු ය. අදහස් ප්‍රකාශනයේ නිදහස, පුවත්පත් නිදහස සහ සමාගමයේ නිදහස අන්තර්ජාතික ප්‍රමිතීන් සමග අනුකූල වන සේ නීතියෙන් සුරක්ෂණය විය යුතු ය. එපමණක් නොව, සියලු ශ්‍රී ලාංකේය මාධ්‍යයන් ගේ ජනමාධ්‍යවේදීන් ගේ ස්වාධීනත්වය සුරක්ෂණය කරමින් අභ්‍යන්තර කර්තෘ මණ්ඩල තත්වයන් හා සෙසු ප්‍රතිපාදන පනවා ගැනීම මාධ්‍ය ප්‍රතිපත්තිය විසින් ධෛර්යමත් කළ යුතු ය.

විකාශන මාධ්‍ය ප්‍රතිසංස්කරණ තනි පක්ෂයක හෝ කොටසක වගකීමක් හෝ ආධීනතාවයක් නොවේ. එය මේ පිළිබඳ ව උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන්ගේ සමෝධානිත පරිශ්‍රමයක් වන අතර ඔවුන්ගේ තීරණ ගැනීම, ඉවසීම, සංවේදීත්වය, උපාය කෞශල්‍යය සෑම කල්හි ම උවමනා කෙරේ. මෙහිදී බැඳියාවන් පිළිබඳ පිළිගැටුම් උද්ගත වීමේ නැඹුරුවක් පවතින අතර, අරමුණ වෙතින් අපගමනය වීමකින් තොර ව ඒවා විසඳාගත යුතු ය.

ජනතාව විසින් ස්වකීය නියෝජිතයන් තෝරාපත් කර ගන්නා සහ නිතර මැතිවරණ පවත්වනු ලබන, බටහිර පන්නයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කීර්තියක් උසුළන්නේ වුවද, පවතින ක්‍රමය සදෝෂී වූවකි. මේ නිසා බටහිර මොඩලයේ උද්සෝෂණ, කේවල්කිරීම්, කැළඹිලි, විරෝධතා සහ නීතියේ පිහිට පැතීම පවා බටහිර ප්‍රජාතන්ත්‍රවාදයේ දී මෙන් සමාන ප්‍රතිඵල ලබා නොදේ. මේ නිසා ප්‍රායෝගික ව සලකා බලා එකිනෙකට වෙනස් ක්‍රමෝපායයන් සහ ප්‍රවේශයන් අනුරූපණය කර පනවා ගත හැක. මෙකී නිරීක්ෂණය හා මතය බාහිර අයෙකු හට අතිශය විවාදශීලී ලෙස පෙනී යා හැකි වුවත් මෙය, වසර ගණනාවක් මුළුල්ලේ මේ රටේ 'ප්‍රජාතන්ත්‍රවාදය' භාවිතා කිරීම තුළින් අපට උගැනීම ට සිදුවූ පාඩමකි. පෙනෙන ආකාරයට මෙය දුෂ්කර කාර්යයකි. ප්‍රතිඵල ලද හැකි එකම ක්‍රමය වන්නේ මාධ්‍ය අධ්‍යාපනය ද ඇතුළත් ව අධ්‍යාපනය සහ දැනුවත් කිරීම් හරහා ය.

මාධ්‍ය අධ්‍යාපනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් නැති හෙයින්ද, එය සමස්තයක් ලෙස රටේ අවශ්‍යතා කෙරෙහි නොව කර්මාන්තයේ නියත අවශ්‍යතා වෙත සිරවී ඇති හෙයින් ද මේ රටේ මාධ්‍ය අධ්‍යාපනය අපිළිවෙළින් යුතු අවුල්සහගත එකක් යැයි අපි විශ්වාස කරමු. මාධ්‍ය රෝගී කරන්නේ මොනවාද යන්න පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබාදී තිබුණ ද මාධ්‍යයට බලපෑම් කරන්නේ මොනවාද යන්න මාධ්‍යයේ පවා අවධානය ට ලක් වන්නේ මද වශයෙනි. මීට වඩා දැවැන්ත හා ක්ෂණික ව අවධානය යොමුකළ යුතු දැවෙන ප්‍රශ්න රටේ තිබෙ බව බැලූ බැල්ම ට මුලින් පෙනී යා හැක. නමුත් යමෙකු ගැඹුර ට මේ දෙස බලන්නේ නම්, බොහෝ ප්‍රශ්නවල ප්‍රභවය හා ප්‍රතිඵල යන ද්විත්වය ම වෙත මාධ්‍ය සාක්ෂරතාවයේ සම්බන්ධතා තිබෙන බව පෙනී යනු ඇත. මේ අනුව මාධ්‍ය සාක්ෂරතාවය මාධ්‍යකරුවන් හා අධ්‍යාපනඥයන්ගේ පමණක් නොව මාධ්‍ය නිදහස වෙනුවෙන් සටන් කරන්නන්, මානව හිමිකම් ක්‍රියාකාරීන්, නෛතික ගැටලු පිළිබඳ වෘත්තිකයන්, සිවිල් සමාජය, ආගමික නායකයන්, බුද්ධිමතුන්, විද්වතුන් සහ පුරවැසියන්ගෙන් බහුතරය ඇතුළු මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන්ගේ සැලකිල්ලට ලක්වන්නක් වේ.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතියක් ශ්‍රී ලංකාව විසින් පනවා ගැනීම අවශ්‍ය වේ. තවද නඩුතීන්දුවල සාධාරණ විවේචනයට අවකාශ සලසන අධිකරණය ට අපහාස කිරීම පිළිබඳ නීතියක් සංග්‍රහගත කළ යුතු වේ. එසේම ප්‍රජා ගුවන්විදුලිය සහ මහජන සේවා විකාශයේ ස්වාධීන

යාමනය සහතික කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අන්තර්ජාතික ප්‍රමිතීන් සමග එක්ව ගමන් කරන පරිදි ප්‍රතිසංස්කරණය ට ලක්කිරීම සහ හදිසි නීති රෙගුලාසි මාධ්‍යයට අනවශ්‍ය තර්ජනයක් හෝ උත්තර්ජනයක් නොවන බව ට වගබලාගැනීම ශ්‍රී ලංකාව විසින් නොපමාව සිදුකළ යුතු නීති ප්‍රතිසංස්කරණ අතර වේ.

යෝග්‍ය හා ඵලදායී මාධ්‍ය අධ්‍යාපනික වැඩසටහන් සුදුසු ලෙස ඇති කළ යුතු යැයි අපි යෝජනා කරමු. මෙම වැදගත් කාර්යය ඉටුකිරීම සඳහා ඉහත සඳහන් කළ පාර්ශවයන්ගෙන් ඇතැමකගේ නියෝජිතයන්ගෙන් සමන්විත, මුළුමනින් ම ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීමට අපි යෝජනා කරමු. එම ආයතනය රටේ මාධ්‍ය අධ්‍යාපනික වැඩසටහන් ක්‍රමවත් කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය සහ ඒවා යාවත්කාලීන කිරීම සඳහා වේ. එසේම, ස්වතන්ත්‍ර සහ ස්වාධීන ආයතනයක් වශයෙන්, ඇතැම්විට ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය මෙන් ආකෘතිගත කළ මාධ්‍ය පර්යේෂණ හා අධ්‍යයන කේන්ද්‍රයක් විද්වතුන්, මාධ්‍ය කර්මාන්තය, මාධ්‍ය සංවිධාන, ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, සිවිල් සමාජ සංවිධාන සහ වෙනත් එවැනි සංරචකයන්ගේ නියොජිතයන්ගේ සමථයෙන් යුතු ව ස්ථාපිත කිරීම ට අපි යොජනා කරමු. එය පහසුකම් සැලසීම පමණක් නොව මග පෙන්වීම, සහය ලබාදීම හා දිරිමත්කිරීම ලබාදෙන සම්පත් ආයතනයක් ලෙස ක්‍රියා කළ යුතු ය. මාධ්‍ය සිසුන් මෙහි ස්වෙච්ඡා පදනම මත සේවයේ යෙදවිය යුතු වන අතර මෙමගින් ඔවුන් ට දැනුම සහ අත්දැකීම් ලබාගැනීම ට හැකි වනු ඇත. කිසිවෙකු ට මෙය තර්ජනයක් හෝ අනතුරක් ලෙස නොහැඟෙනු ඇති නිසා මේ ආකාරයේ කටයුත්තක ට සියලු පාර්ශවයන්ගේ ආශිර්වාදය ලැබෙනු ඇත. කෙසේ වෙතත් මේ ක්‍රමය වාසිසහගත වන අතර නිසැක වශයෙන් ම එම වාසි අප්‍රමාණ වේ.